ධීවර අමාත්‍යාංශය

கடற்றொழில் அமைச்சு

Ministry of Fisheries

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT



2018

ලංකා ධීවර සංස්ථාව

Ceylon Fisheries Corporation

இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனம்

ධීවර අමාත්‍යාංශය

ලංකා ධීවර සංස්ථාව

වාර්ෂික වාර්තාව

2018

පටුන	පිටුව
• ලංකා ධීවර සංස්ථාව ස්ථාපිත කිරීම සහ නෛතික තත්ත්වය	01-02
• දැක්ම සහ මෙහෙවර	03
• ආයතනික තොරතුරු	04-05
• ගරු ධීවර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ ලිපිය	06
• සභාපතිගේ සමාලෝචනය	07-08
• අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	09-11
• විගණකාධිපතිගේ වාර්තාව	12
• මූල්‍ය ප්‍රකාශණ	13
• අනුපාත විශ්ලේෂණය	14
• සේවක විස්තර වාර්තාව	15

ලංකා ධීවර සංස්ථාව ස්ථාපිත කිරීම සහ නෛතික තත්ත්වය

ලංකා ධීවර සංස්ථාව 1957 අංක 49 දරන ලංකා කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 වසරේදී ස්ථාපනය කරනු ලැබූ අතර එහි වාණිජ මෙහෙයුම් 1965 වසරේදී ආරම්භ විය. ආරම්භයේදී සංස්ථාවේ අරමුණු මඟින් සමස්ත ධීවර ක්ෂේත්‍රයම ආවරණය කරන ලදී. 1964 ඔක්තෝබර් මස 1 වන දින අංක 14186 දරන ලංකා රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් සංස්ථාවේ අරමුණු ප්‍රකාශයට පත් කළ අතර ඒවා පහත දැක්වේ.

- ගැඹුරු මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා ට්‍රෝලර් යාත්‍රා භාවිතා කරමින් සංස්ථාව සෘජුවම හෝ තම බලයලත් නියෝජිතයන් හරහා මත්ස්‍ය නිෂ්පාදනයේ නියැළිය යුතුය.

- සංස්ථාව සෘජුවම හෝ තම බලයලත් නියෝජිතයන් හරහා මත්ස්‍ය පිරිසැකසුමේ (ටින් කිරීම සහ වියළීම. පිරිසැකසීම) සහ මත්ස්‍ය අතුරු නිෂ්පාදන නිපදවීමේ නියැළිය යුතුය .

- සංස්ථාව සෘජුවම හෝ තම බලයලත් නියෝජිතයන් හරහා තොග හා සිල්ලර පදනමින් මසුන් බෙදා හැරීමේ හා විකිණීමේ නිරත විය යුතුය.

- ධීවර වරාය, ශීත ගබඩා සහිත නැංගුරම් පොළ ඉදිකිරීම හා නඩත්තුව

- මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සහ අපනයනය

- ධීවර කර්මාන්තය සඳහා ධීවර ආම්පන්න හා අවශ්‍ය උපකරණ ආනයනය හා විකිණීම

- ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමේ කාර්යය වෙනුවෙන් ධීවර දෙපාර්තමේන්තුව හෝ වෙනත් යම් රජයේ දෙපාර්තමේන්තු සඳහා හෝ වෙනුවෙන් සංස්ථාව කටයුතු කළ යුතුය.

- ධීවර කර්මාන්තය සඳහා බෝට්ටු හා කුඩා නැව් තැනීම.

- ධීවර බෝට්ටු අළුත්වැඩියාව හා නඩත්තුව සඳහා පහසුකම් සැපයීම.

- ධීවර උපකරණ නිෂ්පාදනය හා අලෙවිය

මෙම ඇතැම් කර්තව්‍ය මේ වන විට ඉවත් කොට ඇති බව සටහන් කළ යුතුය. 2011 ජූනි 30 දිනැති අංක 1712/21 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ ඉහත සඳහන් ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නියමයේ (V) වැනි අයිතමය වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කරමින් එම නියමය සංශෝධනය කරනු ලැබීය.

- "ස්ව සම්පත් කලාපය" සහ පිළිගත් ජාත්‍යන්තර රීතිවලට අනුකූලව ඉන් පිටත මසුන් ඇල්ලීමේ මෙහෙයුම්වල නිරතවීම.

- මත්ස්‍ය පිරිසැකසුම.

- විදේශීය සහ දේශීය වෙළඳවළවල්වල මසුන් විකිණීම.

- අවශ්‍ය යැයි පෙනී යන අවස්ථාවක දී මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සහ අපනයනය කිරීම සඳහා අවශ්‍යවන්නා වූ යම් කටයුතු සිදු කරගෙන යාම.

- ඉහත කටයුතුවලින් යම් කටයුත්තක් සිදු කිරීම සඳහා දේශීය සහ විදේශීය ආයෝජකයන් සමග හවුල් ව්‍යවසාය ගිවිසුම්වලට ඇතුල්වීම.

- දේශීය සහ විදේශීය නිෂ්පාදනයන් සහ බෙදා හරින්නන් නියෝජනය කිරීම.

ඉහත ප්‍රතිශෝධිත අරමුණුවලට අමතරව, ලංකා ධීවර සංස්ථාවේ ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් 04 ක් මේ වන විට සිදු කරමින් පවතී.

- සංස්ථා අලෙවිසල් හරහා මත්ස්‍ය වෙළඳාම

- අසුරන ලද ශීතකළ මසුන් විකිණීම

- දිවයින පුරා ව්‍යාපාරික පහසුකම් පුළුල් කිරීම සහ මසුන් වෙළඳාම ඉහළ නැංවීම

- අයිස් සහ ශීතාගාර පහසුකම් සැපයීම

දැක්ම

ධීවර නිෂ්පාදකයාගේ හා පාරිභෝගිකයාගේ සුභසිද්ධිය උදෙසා ධීවර නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධන කිරීම සහ මග පෙන්වීමේ ප්‍රමුඛතම වාණිජමය ආයතනය බවට පත්වීම

මෙහෙවර

- ඵලදායී සංවිධානයක් වශයෙන් දළ දේශීය නිෂ්පාදනයට උපරිම දායකත්වය ලබාදීම.
- **මසුන් නිෂ්පාදනය, සැකසුම් කිරීම හා අලෙවි කිරීම සඳහා වගකීමෙන් හා සැලකීමෙන් යුක්ත** අර්ථාන්විත ආයතනයක් වීම.
- ධීවර කාර්මිකයාගේ ආර්ථික හැකියාව ශක්තිමත් කිරීම හා එහි නිෂ්පාදන ධාරිතාව නගා සිටුවීම මත ඉහළ සංවර්ධනයක් ලබා ගැනීම.
- නවීන තාක්ෂණය යොදා ගනිමින් සාධාරණ මිලකට උසස් තත්ත්වයෙන් යුත් මසුන් සහ අගය එකතු කරන ලද නිෂ්පාදනයන්හි නිෂ්පාදන කටයුතුවල හා අලෙවි කටයුතුවල නිරතවීම.
- පාරිභෝගිකයාගේ ප්‍රෝටීන අවශ්‍යතා සපුරාලීමට වැඩි දායකත්වයක් ලබා දීම.

ආයතනික තොරතුරු

සංස්ථාවේ නම	:	ලංකා ධීවර සංස්ථාව
නෛතික ස්වරූපය	:	රාජ්‍ය සංස්ථාවකි
සංස්ථාපිත දිනය	:	1964 ඔක්තෝබර් 1 (1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත)

අධ්‍යක්ෂවරු

- බී.කේ.ජගත් කුමාර පෙරේරා මහතා - සභාපති (2018 මැයි 18 දක්වා)
- හේමාල් ගුණසේකර මහතා - සභාපති (2018 මැයි 15 සිට 2018 දෙසැම්බර් 31 දක්වා)
- පී.ඒ. සිරිනිමල් පෙරේරා මහතා - කළමනාකරණ අධ්‍යක්ෂ (2018 මැයි 18 දක්වා)
- නිපුණ සොයිසා මහතා - කළමනාකරණ අධ්‍යක්ෂ (2018 මැයි 15 සිට 2018 දෙසැම්බර් 31 දක්වා)
- එච්.ජී. සුමනසිංහ මහතා - අධ්‍යක්ෂ, භාණ්ඩාගාර නියෝජිත
- ජී.අශෝක විජේරත්න මහතා - අධ්‍යක්ෂ
- එන්.පී.කේ. රණවීර මහතා - අධ්‍යක්ෂ
- සුනිල් එදිරිසූරිය මහතා - අධ්‍යක්ෂ
- අශෝක ද මෙල් මහතා - අධ්‍යක්ෂ
- කේ.එච්. හේමචන්ද්‍ර මහතා - අධ්‍යක්ෂ
- ඩී.එච්. ජයසිංහ මහතා - අධ්‍යක්ෂ
- හිරාන් අසංක මහතා - අධ්‍යක්ෂ
- සමන් ඉන්දික මානවගේ - අධ්‍යක්ෂ

ජ්‍යෂ්ඨ කළමනාකාරිත්වය

➢ නිලාන් ක්‍රිෂාන්ත මිරැන්ඩෝ මහතා	-	සාමාන්‍යාධිකාරී
➢ දහම්කිත් පුස්සැල්ල මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්
➢ දුමින්ද රුවන් මුණසිංහ මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි
➢ යූ. ජානක පාලින්ද සේනාරත්න මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත්
➢ ඒ.ජේ.සී. කුමුදුනි මෙනෙවිය	-	මූල්‍ය කළමනාකරු
➢ ඩී.සී. කරුණාතිලක මහතා	-	අභ්‍යන්තර විගණන නිලධාරී
➢ කේ.වී.එච්. බණ්ඩාරනායක මිය	-	නීති නිලධාරී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

➢ ලියාපදිංචි කාර්යාලය	-	අංක 15, රොක් හවුස් පටුමග, මෝදර, කොළඹ 15
➢ විගණකවරු	-	විගණකාධිපති
➢ බැංකුකරුවෝ	-	ලංකා බැංකුව මහජන බැංකුව

ගරු ඊවර අමාත්‍යතුමාට ඉදිරිපත් කළ ලිපිය

රොක් හවුස් පටුමග,
මෝදර,
කොළඹ 15
2024 ජූනි 12

ඩග්ලස් දේවානන්දා මහතා
ගරු ඊවර අමාත්‍ය
ඊවර අමාත්‍යාංශය
මාළිගාවත්ත
කොළඹ -10

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (ඇ) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය ප්‍රකාරව මා විසින් 2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඊවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

1.අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2. 2018 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා විගණකාධිපති වාර්තාව

3. 2018 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

4. 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

5. ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

6. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

7. මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

8. ආදායම් ප්‍රකාශය සඳහා උපලේඛන සහ ශේෂ පත්‍රය

මෙම වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී වූ,

තුෂාර සී. ලොකුකුමාර
සභාපති
ලංකා ඊවර සංස්ථාව

සභාපතිගේ සමාලෝචනය

ශ්‍රී ලංකා මත්ස්‍ය වෙළඳපොළට පිවිසි රජයට අයත් රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස, ධීවර ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නංවාලීමට සහ පාරිභෝගිකයන්ට සාධාරණ මිලට මසුන් ලබාදීම සහතික කිරීමේ වගකීමක් ලංකා ධීවර සංස්ථාව සතු වේ. මෙහිදී මසුන් සෑම පාරිභෝගික කණ්ඩායම්වලටම මිලදි ගැනීමේ ශක්තිය තුළ පවතින බව සහතික කිරීම අරමුණු කරන අතර එමගින් ජීවන වියදම පහත හෙළීමට සහ ජාතියේ ප්‍රෝටීන අවශ්‍යතා සපුරාලීම පිණිස පෝෂ්‍යදායී, ගුණාත්මක මසුන් සැපයීවට අපේක්ෂා කරනු ලබයි.

රජයට අයත් රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස, දිගු කාලීනව ඉහළ සාර්ථකත්වයක් අත්කර ගැනීමේ විභවය සංස්ථාව සතු අතර ධීවර කර්මාන්තය ඉහළම ධාරිතා කරා ගමන් කරමින් සිටින බැවින් ව්‍යාපෘති තවදුරටත් පුළුල් කිරීමට වඩාත්ම යෝග්‍ය අවස්ථාව මෙය වේ. විවෘත වෙළඳපොළෙහි ධීවර අංශය වඩාත් අභියෝගාත්මක වෙමින් පවතින බැවින් අතිශයින් තරඟකාරී වෙළඳපොළ තුළ ආකර්ෂණීය මිලකරණ උපාය මාර්ග, නිෂ්පාදන විවිධාංගීකරණය, ප්‍රවර්ධන ව්‍යාපාර යොදා ගැනීම මගින් එම තත්ත්වයට මුහුණ දීමට ධීවර සංස්ථාව සිය පූර්ණ ශක්තිය දායක කරයි.

1. මසුන් මිළදී ගැනීම සහ විකිණීම

ධීවරයන්ගෙන් සෘජුවම මසුන් මිලදී ගැනීම මගින් ඔවුන්ගේ මත්ස්‍ය අස්වැන්නට හොඳම මිල ගෙවීම සහතික කරයි. සඵල පාරිභෝගික සේවාවක් සැපයීම පිණිස, ධීවර සංස්ථාව සිය නිෂ්පාදන ඉහළම ගුණාත්මකබවින් යුතුව අඩු මිලකට අලෙවි කරයි. ඒ අතරම, මෙම ක්‍රියාදාම මගින් ආයතනයේ ස්වශක්තතාව ඉහළ නැංවේ. ධීවරයන්ගේ ජීවනෝපාය ශක්තිමත් කිරීම පිණිස ඔවුන්ගේ මත්ස්‍ය අස්වැන්න මිලදී ගැනීම සඳහා සංස්ථාව ත්‍රිකුණාමලය, පේසාලෙයි, යාපනය වනැ ධීවර ගම්මානවල බොහෝ ධීවරයන් සහ ධීවර ප්‍රජාව සමග සාකච්ඡා පවත්වා ඇත. එසේම, නව මිලදී ගැනීමේ මධ්‍යස්ථාන විවෘත කිරීම, සංස්ථාවේ මිලදී ගැනීමේ හැකියාව ඉහළ නැංවීමට ද උපකාරක වේ. වර්ෂය තුළ සංස්ථාව මසුන් මෙට්රික් ටොන් 5876 ක් මිලදී ගන්නා ලදී.

සංස්ථාව සිය අලෙවි ජාලය හා ජංගම සේවා ජාලය හරහා අලෙවි කිරීම මගින් සහ රජයේ රෝහල්වලට සහ අනෙකුත් රාජ්‍ය ආයතනවලට සැපයීම මගින් මාළු මෙට්රික් ටොන් 5775 ක් අලෙවිකර තිබේ.

2018 වර්ෂය තුළදී, භාණ්ඩාගාරයෙන් ලත් ප්‍රදානය යොදා ගනිමින්, වෙළඳපොල ප්‍රමුඛයා ලෙස උත්සව සමයන්හිදී (සිංහල හා හින්දු අළුත් අවුරුද්ද) සහනදායී මිලට පාරිභෝගිකයන්ට සැපයූ අතර එසේම එම උත්සව කාලයන්හිදී ඉතා සාර්ථකව පාරිභෝගිකයන්ට අවශ්‍ය මසුන් මිලදී ගැනීම පිණිස පහසුකම් සපයන ලදී. මෙම කාලය තුළ ධීවර සංස්ථාව ඉතා ඉහළ අලෙවියක් වාර්තා කරන ලදී.

2. අයිස් නිෂ්පාදනය සහ අලෙවිය

අයිස් නිෂ්පාදනය සහ අලෙවිය සංස්ථාවේ තවත් ආදායම් මාර්ගයක් වන අතර අනුරාධපුර, ගාල්ල, හම්බන්තොට සහ මිරිස්ස යන ප්‍රදේශවල අයිස් යන්ත්‍රාගාර ක්‍රියාත්මක කරනු ලබයි. වාර්ෂික අයිස් අලෙවිය මෙට්‍රික් ටොන් 10035 ක් වූ අතර යන්ත්‍රාගාර මගින් අයිස් නිෂ්පාදනය කොට විකිණීම දීප ව්‍යාප්තව සිදු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කර තිබේ.

3. ටින්කළ මාළු අලෙවිය

ටින්කළ මාළු නිෂ්පාදනය සඳහා ගාල්ල අයිස් යන්ත්‍රාගාර පරිශ්‍රය හැපි කුක් ලංකා පුද්ගලික සමාගමට ධීවර සංස්ථාව කුලියට ලබා දී තිබේ.

සේවා

- **ශීතාගාර පහසුකම්**

  මෙට්‍රික් ටොන් 350 ක ධාරිතාවයෙන් යුතු ධීවර සංස්ථාවට අයත් ප්‍රධානතම ශීතාගාරය මෝදර ධීවර වරාය පරිශ්‍රයේ පිහිටා ඇත. එය මේ වන විට වසර 10ක කාලයකට පුද්ගලික අංශයට බදු දී ඇත. එසේම ප්‍රධාන කාර්යාලයේ සහ මහනුවර, ගාල්ල හා බණ්ඩාරවෙල ප්‍රදේශයන්හි ජංගම ශීතාගාර පහසුකම් ස්ථාපනය කර ඇත.

- **සංචාරක බංගලා**

  කලමැටිය, මින්නේරිය සහ නුවරඑළිය පිහිටි සංස්ථාවට අයත් නවීන පහසුකම්වලින් සමන්විත සංචාරක බංගලා තුළින් ආකර්ෂණීය අත්දැකීමක් පළපුරුදු කාර්ය මණ්ඩලයක සේවය හරහා අපගේ සේවාලාභීන් වෙත ලබා දෙයි.

ලාභාලාභ

පෙර වසරේ රු. මිලියන 2.21 ක අනුරූපී ශුද්ධ ලාභය සමග සැසඳීමේදී 2018 වසර සඳහා සංස්ථාව රු. මිලියන 34.0 ක අලාභයක් වාර්තා කර ඇත.

තුෂාර සී ලොකුකුමාර
සභාපති
ලංකා ධීවර සංස්ථාව

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව එම කාලසීමාව සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ද සමග ලංකා ධීවර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඉදිරිපත් කරයි.

ලංකා ධීවර සංස්ථාව 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී.

සංස්ථාව ධීවර අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ.

2018 වර්ෂය තුළ සංස්ථාව ඉටු කළ ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි සාරාංශ ගත කළ හැත.

- දේශීයව මසුන් මිලදී ගැනීම සහ ආනයනය
- සිල්ලර හා තොග පදනමින් මසුන් අලෙවිය
- අයිස් නිෂ්පාදනය සහ අලෙවිය
- ශීතාගාර පහසුකම් සැපයීම

ව්‍යාපාරික කටයුතු සමාලෝචනය

මෙම අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ අනුකලන කොටසක් වන සභාපතිගේ සමාලෝචනය යටතේ සංස්ථාව සහ එහි කටයුතු පිළිබඳ ඇගයීමක් අන්තර්ගත වේ.


මූල්‍ය ව්‍යුහය

2013,2014, 2015,2016 සහ 2017 වර්ෂවල මුළු ශුද්ධ ලාභය සැලකිල්ලට ගැනීමේදී අනුපිළිවෙළින් රු. බිලියන 54.45, 119.19, 259.9, 247.22 ක ශුද්ධ ලාභයක් පෙන්නුම් කරන අතර සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 34.0 ක ශුද්ධ අලාභයක් පෙන්නුම් කරයි.

මුළු ආදායම් සහ ලාභාලාභ

වර්ෂය	මුළු ආදායම් රු.මි	දළ ලාභය/අලාභය රු.මි.	ශුද්ධ ලාභය/අලාභය රු.මි.
2011	1977	605.17	(68.97)
2012	2079	701.19	(41.76)
2013	1940	657.36	(54.45)
2014	1855	563.26	(119.18)
2015	1783	428.97	(259.90)
2016	2736	445.13	247.80
2017	2127	503.16	2.00
2018	2941	521.5	(34.00)

මුළු ආදායම් සහ ලාභ හා අලාභ



කාර්ය මණ්ඩලය

විධායක	-	37
ලිපිකාර, තාක්ෂණික සමාන්තර ශ්‍රේණි සුළු සේවකයන්	-	313
කණිෂ්ඨ කාර්ය මණ්ඩලය	-	329
		679

විනය ක්‍රියාමාර්ග

නැත

විධායක තනතුරු සඳහා බඳවාගැනීම්

නැත

විධායක තනතුරුවලින් ඉල්ලා අස්වීම්

නැත

ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම්

ලංකා ධීවර සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලට අදාළ කිසිදු ගිවිසුමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ කිසිදු බැඳීමක් නොමැත.

ස්තුතිය

සංස්ථාවේ අභිවෘද්ධිය සහ සාර්ථකත්වය උදෙසා ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමන් විසින් ලබා දෙන ලද සියලු වටිනා උපදෙස්, සහයෝගය සහ මගපෙන්වීම පිළිබඳව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය ස්තුතිය පළකර සිටී. ධීවර අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු සියලුම නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෘදයාංගමව අගය කර සිටී. මෙම වර්ෂය තුළදී අප වෙත ලබා දෙන ලද සහයෝගය පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ සියලු නිලධාරීන්ට අපගේ ස්තුතිය පළකර සිටින්නෙමු. තවද ජාතික විගණන කාර්යාලයේ විගණකාධිපතිවරයාටද ඔවුන්ගේ සේවය වෙනුවෙන් ස්තුතිය පළකර සිටිමු.

අපගේ වටිනාම වත්කම වනුයේ අපගේ සේවකයන් ය. වර්ෂය තුළදී ලබා දුන් සේවා සහ සහයෝගය වෙනුවෙන් සියලු සේවකයන්ට අපගේ ස්තුතිය පිරි නමන්නෙමු.

එසේම අපගේ වටිනා පාරිභෝගිකයන්, රාජ්‍ය ආයතන වෙත ද අධ්‍යක්ෂ මණ්ඩලය තම ස්තුතිය ප්‍රකාශ කර සිටින අතර ලංකා බැංකුව සහ මහජන බැංකුව විසින් නිරන්තරයෙන් දක්වන ලද ඔවුන්ගේ සහයෝගය සහ අප කෙරෙහි දක්වන ලද විශ්වාසය පිළිබඳව එම බැංකුවල නිලධාරීන් වෙත විශේෂ ස්තුතිය පළකර සිටිමු.

ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.
එෆ්එල්එස්/ඩී/සීඑෆ්සී/1/එෆ්ජේ/2018/01

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2024 මැයි 06 දින

CHAIRMAN
9947
09 MAY 2024
3.00pm

සභාපති,
ලංකා ධීවර සංස්ථාව

ලංකා ධීවර සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :-
1. ලේකම්, ධීවර අමාත්‍යාංශය
2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එෆ්එල්එස්/ඩී/සීඑෆ්සී/1/එෆ්ඒ/2018/01

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2024 මැයි 06 දින

සභාපති,
ලංකා ධීවර සංස්ථාව.

ලංකා ධීවර සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාවනය

ලංකා ධීවර සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 32 වන ඡේදය ප්‍රකාරව වත්කම් හා වගකීම් හිලව් කළ නොහැකි වන අතර රු.9,650,711 ක්වූ බැර ශේෂයන් වෙළඳ හා වෙනත් ලැබිය යුතු ගිණුමේ හර ශේෂයට හිලව්කර 2018 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.348,961,758ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 08 හි ඡේද අංක 21, 22, 23 හා 24 ප්‍රකාරව ව්‍යාපාරයක වාර්තා කරන ලද ලාභය හෝ අලාභය සමන්විත වන උපකොටස්හි ආදායම් සහ වියදම් ද ඇතුළුව ලාභය හෝ අලාභය මූල්‍ය ප්‍රකාශන තුලින් හෙලිදරව් කල යුතු වුවද සංස්ථාවේ විධායකද ඇතුලත්ව අංශ 46ක ලාභාලාභ එසේ හෙලිදරව් කිරීමකින් තොරව සංස්ථා මූල්‍ය ප්‍රකාශන තුල පෙන්වා තිබුණි.

(ඇ) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ යටතේ ගිණුම්ගත කර ඇති රු.290,531,366 ක්වූ වෙළෙඳ ණයගැති ශේෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 8 හි 32 වගන්තිය ප්‍රකාරව අඩමාණ ණය වෙන්කර නොතිබුණි. මෙම ශේෂය තුළ මේ වන විට මෙහෙයුම් කටයුතු නවතා ඇති විධායක 24ක ණයගැති ශේෂය රු.33,697,712 ක් ද සක්‍රීය තත්ත්වයේ පවතින ඉතිරි ණයගැති ශේෂයන්ගෙන් වර්ෂ 5කට අධික කාලයක සිට පැවත එන රු.93,120,340 ක ණය ශේෂය ද අයකර ගැනීම අවිනිශ්චිත තත්වයේ වූ අතර රු.290,531,366 ක්වූ ණයගැති ශේෂය සඳහා ශේෂ සනාථන ද ඉදිරිපත් නොවිය.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 7 ඡේදයට පටහැනිව 2014 වර්ෂයේදී ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා මුල්ගල් තැබීම හා උත්සව කටයුතු සඳහා දැරූ රු.1,954,653 ක වියදම කෙරිගෙන යන වැඩ ලෙස ගිණුම් තබා තිබුණද සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු නොකිරීම නිසා එම ප්‍රමාණයෙන් කෙරිගෙන යන වැඩ වැඩියෙන් හා සමුච්චිත අලාභය අඩුවෙන් සටහන් වී තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 34 වන ඡේදය ප්‍රකාරව, වත්කම් වසර 3 කට හෝ 5 කට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුව ද, සංස්ථාවේ රු.1,367,837,080 ක් වටිනා වත්කම් 2013 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කළ පසු මේ දක්වා යළි ප්‍රත්‍යාගණනය කර නොතිබුණි තවද මෙම ගිණුම්කරණ ප්‍රමිතියේ 39 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය හේතුවෙන්, ධාරණ අගයේ වැඩිවීම තුළ 2013 වර්ෂයේ ඇතිවූ ප්‍රත්‍යාගණන අතිරික්තය අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව වසර 5 ක් පුරා සමුච්චිත ලාභයට ලියාහැරීමට තීරණය කිරීම හේතුවෙන් ගිණුම්කරණ ප්‍රමිතියට පටහැනිව සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් ලෙස රු.45,328,629ක් බැර කර තිබුණි. ඊට අමතරව මෙම ප්‍රමිතියේ ඡේද 50 හා 51 අනුව භාවිතයට ගනු ලබන වත්කම්වල ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය කර ඵලදායි ජීවකාලයක් ඇස්තමේන්තු කර ගිණුම්වල ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම්ගත කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 ප්‍රකාරව පුනරාවර්ථන වියදම් සඳහා ලැබෙන රාජ්‍ය ප්‍රදාන අදාළ වර්ෂයේදීම සම්පූර්ණයෙන්ම ආදායමක් ලෙස හඳුනාගත යුතු වුවත් 2018 මාර්තු 29 දින මහා භාණ්ඩාගාරය විසින් සීවර සංස්ථාව වෙත උත්සව සමයේ සහන මිලට

මසුන් අලෙවි කිරීම සඳහා ලද ප්‍රදානය වූ රු.100,000,000 ක මුදල හා රු.536,823,086 ක ආරම්භක ශේෂයද සමඟින් එකතුව රු.636,823,086 ක් වූ මුදලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.71,249,205 ක් පමණක් ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 ප්‍රකාරව සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව ගෙන ඇති අධිකරණ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර හෙළිදරව් කර ඇති නමුත් බාහිර පාර්ශවයන් විසින් සංස්ථාවට එරෙහිව ගෙන ඇති අධිකරණ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 හි 33 ඡේදය ප්‍රකාරව ආයෝජන දේපළ එහි සාධාරණ වටිනාකම අනුව ගිණුම්ගත කිරීමට තෝරාගත් විට සියළු ආයෝජන දේපළ එම සාධාරණ වටිනාකමට වාර්ෂිකව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළයුතු වුව ද රු.71,211,250 ක් වූ දේපළ සඳහා එලෙස කටයුතු කර නොතිබුණි.

(එ) ස්ථාවර වත්කම් ලේඛනය තුළ ඇතුළත් LB 9108 දරන ලොරි රථය හා KA7699 දරන මෝටර් රථය අමාත්‍යාංශයෙන් සංස්ථාව වෙත ලැබී තිබුණු අතර එම වත්කම් පවරාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2018 දෙසැම්බර් 31 දිනට වූ දේපල පිරියන හා උපකරණ ශේෂයෙහි ඇතුලත් උපකරණ වර්ග 113 ක්, අයිස් යන්ත්‍රාගාර හා ශීතාගාර 271 ක්, ලී බඩු හා සවිකිරීම් 208ක්, පරිගණක දෘඩාංග අයිතම 17 ක් ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් කර තිබුණ ද එහි වටිනාකම් සඳහන් කර නොතිබුණි.

(ඒ) කුරුණෑගල ගැට්ටුවාන පිහිටි අක්කර 01 පර්චස් 28 ක්වූ භූමියෙන් අයිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා පර්චස් 59.4 ක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ගෙන තිබුණි. ඉතිරි පර්චස් 128.6ක ප්‍රමාණයෙන් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ගිණුම්ගත කිරීමට කටයුතු කර තිබුණේ පර්චස් 56.6ක් පමණි. ඒ අනුව රු.16,200,000ක් වටිනා පර්චස් 72ක බිම් කොටසක් ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. තවද එම ඉඩම පවරා ගැනීමෙන් ලද ලාභය වූ රු.64,572,650 ක මුදල් වෙනත් ආදායම්වලට ඇතුළත් කර තිබූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් අලාභයට ගලපා නොතිබුණි. පවරා ගැනීමෙන් ලද රු.77,937,650ක මුදල ද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒම් ලෙස පෙන්වා නොතිබුණි.

(ඔ) 2018 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සඳහා විගණකවරුන් සහභාගී වී නොමැති අතර අදාළ වාර්තාද විගණනයට ඉදිරිපත් නොවූ බැවින් සමාලෝචිත වර්ෂයේ රු.34,920,299 ක් වූ තොග වටිනාකම පිළිබඳව තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය. තව ද වසර කිහිපයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ රු.2,558,029 ක ඇසුරුම් තොග ඌනතාවය වත්කමක් ලෙස තොගයට එකතු කර ගිණුම් ගත කර තිබුණි. එම ඌණතාවය නිරවුල් නොවීම හේතුවෙන් සමාලෝචිත වසරේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.

(ක) බදු පෙර ලාභයට ඇතුළත් නොවූ රු.1,496,830 ක පාරිතෝෂික ආයුගණන ලාභය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂයේ මෙහෙයුම් අලාභයට ගලපා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ ගෙවූ පාරිතෝෂික මුදල රු.2,569,412 ක් වුව ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ එය රු.5,071,213 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් රු.2,501,801 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂය තුළ දේපල පිරියත හා උපකරණ එකතු කිරීම් රු.32,654,160 ක් වුව ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් වටිනාකම රු.23,465,924 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් රු.9,188,236 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඝ) 2018 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොවූ රු. 34,945,139ක අවිනිශ්චිත ගිණුම් ශේෂයක් වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වශයෙන් වර්ගීකරණය යටතේ දක්වා තිබූ අතර පරිසණක ගිණුම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2018 ජූනි 26 දින ලබා දී තිබූ රු.300,000 ක අත්තිකාරම් මුදලක් පෙර ගෙවුම් වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ නමින් වන වර්ගීකරණය යටතේ ඇතුළත් කර තිබුණි.

(ච) සමාලෝචිත වර්ෂය දක්වා ඉදිරියට එමින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ඇතුළත් රු.100,000 ක සුළු මුදල් අග්‍රිමය හා රු.3,262,095 ක මාර්ගස්ථ මුදල් තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ඩ) සමලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තුළ රු.2,870,426 ක නොසැසඳුනු ණය හිමි පාලන ගිණුම වශයෙන් වූ ශේෂයක් වෙනත් ගෙවීම් යටතේ දක්වා තිබුණද ඊට අදාළ කේවල ශේෂ කවරේ ද යන්න විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට විධායක 09 ක, ණයගිමි ශේෂය ලෙජර් ගිණුම අනුව රු.88,081,174 ක්ද වයස් විශ්ලේෂණය අනුව රු.71,764,347ක්ද කේවල ශේෂ ලැයිස්තුව අනුව රු.64,472,183ක්ද වශයෙන් එකිනෙක ශේෂයන් නොසැසඳී පැවතුණි. තව ද සංස්ථාවේ විධායකද ඇතුලු අංශ 10ක වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය කේවල ශේෂ ලැයිස්තු අනුව රු.144,853,065 ක්ද ලෙජර් ගිණුම් අනුව රු.126,959,340ක්ද වශයෙන් රු.17,893,725 ක වෙනසක් නිරූපනය විය.

(ණ) ප්‍රධාන කාර්යාලය හා විධායක අතර පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුම් ශේෂ අතරින් විධායක 11 කට අදාළව ප්‍රධාන කාර්යාලය අනුව ශේෂය රු.181,108,366 ක් හා එම විධායකයන්හි ශේෂ එකතුව රු.217,815,976ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ එම ශේෂයන් අතර රු.36,707,610 ක වෙනසක් නිරීක්ෂණය විය. තව ද මූල්‍ය ප්‍රකාශන තුළ ඉකුත් වර්ෂයන්ගෙන් ඉදිරියට ගෙන එනු ලබන එම ජංගම ගිණුම් අතර වෙනස වූ රු.20,672,601 ක් වෙනත් ලැබිය යුතු දෑ ලෙස වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ත) ජාතිය ගොඩනැගීමේ බද්ද පාරිභෝගිකයන්ගෙන් අය කොට දේශීය අදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු වන චක්‍ර බද්දක් වුවද, ලංකා සීවර සංස්ථාවේ 2018 වර්ෂයේදී විකුණුම් මත ගණනය කරන ලද රු.24,047,867ක් වූ ජාතිය ගොඩනැගීමේ බද්ද වියදමක් ලෙසට ගලපා තිබීම හේතුවෙන් එම වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ද) සංස්ථාව විසින් මත්ස්‍ය අලෙවි කටයුතු සඳහා ස.තො.ස ආයතනය සමඟ කිසිදු ගිවිසුම් ගත බැඳීමකින් තොරව සම්බන්ධ වී කටයුතු කිරීම හේතුවෙන් රු.5,367,000 ක ණයගැති ශේෂයක් පැවති නමුත් ස.තො.ස ආයතනය එවැනි ශේෂයක් ඔවුන්ගේ ගිණුම් පොත්වල නොමැති බැව් දන්වා පොත්වලින් කපා හරින ලෙස දැනුම් දී තිබුණ ද මේ

සම්බන්ධයෙන් සංස්ථා කළමනාකරණය එම ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොනිබුණි.

(න) මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කිරීමේ දී විධායක හා අංශ 46 ක් සඳහා වෙන් වෙන් වශයෙන් සකසන ලද පරිගණක මෘදු පිටපත් වලින් යුතු ශේෂ පිරික්සුම් 46 ක් ලබා දී නිබුණ ද මූල්‍ය ප්‍රකාශනයන්හි පවතින ආරම්භක හා අවසාන ශේෂයන් නිවැරදිව සනාථ කර ගැනීමට හැකිවන අයුරින් විධිමත් වූ ශේෂ පිරික්සුමක් විගණනය වෙත ඉදිරිපත් කිරීමට සංස්ථාව කටයුතු කර නොනිබුණි.

(ප) විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් ගිණුම් ශේෂ සනාථ කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

විස්තරය	ශේෂය රු.	ඉදිරිපත් නොකල සාක්ෂි
වෙළඳ ණයගැතියෝ	77,132,660	
සේවක ආරක්ෂිත තැන්පතු	14,774,662	
වෙනත් තැන්පතු	9,442,705	
ආපසු ගෙවිය යුතු තැන්පතු	14,975,900	
ණය සහ ණය ගෙවීම්	142,922,000	
මුහුදු බෙල්ලන් හා මුහුදු කකුළුවන් සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතියට අදාල තැන්පතුව	12,000,000	විස්තරාත්මක උපලේඛන, වයස් විශ්ලේෂණ
උපචිත වියදම්	34,689,792	
ණයහිමි පාලන ගිණුම (කරවල)	1,477,673	
ඉකුත් වර්ෂ ගැලපුම්	49,170,746	
විවිධ ආදායම්	5,671,762	
වෙනත් දීමනා	9,003,682	
ස්ථාවර තැන්පතු	7,867,260	තැන්පතු සහතික
බද්ධ ව්‍යාපාර ආයෝජන	110,000,000	
සම්බන්ධිත පාර්ශවයන් වෙත ගෙවියයුතු	17,049,279	ගිවිසුම් ,එකඟතා හා නියමයන්
ඉදිකිරීම් අත්තිකාරම් (මධ්‍යකලපුව)	500,000	
ණයගිමියන්	22,766,018	
වෙනත් ණය හිමියන්	15,721,266	උපලේඛණ
බැංකු ජංගම ගිණුම් ශේෂ 38 ක්	8,091,284	
NRFC බැංකු ශේෂය	841,343	ශේෂ සනාථ කිරීම්, බැංකු ප්‍රකාශන
බැංකු අයිරා ගිණුම් ශේෂ	44,966,736	බැංකු අයිරා ලබා ගැනීමට අනුමැතිය
ප'නල් සටහන් 324 ක්	3,305,234,663	මූලාශ්‍ර ලියවිලි,ප'නල් සටහන්

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව , සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුව ද, මතය ප්‍රකාශනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා සංස්ථාව තබා තිබෙද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තිය සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති විධානයට යොමුව	විස්තරය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි (අ) මු.රෙ. 757 (2) (අ) හා මු.රෙ.761	රෙගුලාසිය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකොට එම වාර්තාවේ පිටපතක් වහාම විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ වගන්ති අංක 16	බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමේදී ලබා ගතයුතු උපරිම සීමාව සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද එලෙස විධිමත්

අනුමැතියකින් තොරව 2018 දෙසැම්බර් 31 දිනට රු.44,966,587 ක බැංකු අයිරා පහසුකම් ලබා ගෙන තිබුණි.

(ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික මුදල් ගෙවීම් පනත

පාරිතෝෂික අරමුදල් සඳහා හිමිකම් ලබන යම් සේවකයකු ඉවත්වීමේදී දින 30ක් ඇතුළත එකී හිමිකම් ලබන පාරිතෝෂික මුදල් ගෙවියයුතු වුව ද සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික මුදල් ගෙවීම ප්‍රමාදවීම නිසා සේවකයන්ට රු.2,367,619ක දඩ මුදල් ගෙවීමට සිදු වී තිබුණි. විගණිත දිනය වන 2023 දෙසැම්බර් 22 දින වන විට එලෙස ගෙවිය යුතු මුළු පාරිතෝෂික දඩ මුදල රු.5,288,962ක් ද විය.

(ඈ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 26 වගන්තිය

යම් බදු අයකලහැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්ද , එම බදු අයකල හැකි කාලසීමාව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසය අවසාන දිනට පසු දිනයක් නොවන දිනයක ගෙවිය යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දිනට රු.14,062,318 ක් හා 2023 දෙසැම්බර් 22 දින වන විට 2016 සිට 2019 දක්වා කාලයට අදාළව රු. 19,696,372ක මුදලක් එකතු කළ අගය මත බදු ලෙස ගෙවිය යුතුව පැවතුනි.

(ඉ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ වගන්තිය

4 වගන්තිය

කාර්තුවේ ජාතිය ගොඩනැගීමේ බදු, අදාළ කාර්තුව අවසානයේ ඉක්බිතිව එළඹෙන මාසයේ විසි වන දිනදී හෝ එදිනට පෙර දේශීය අදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු වුව ද 2018 දෙසැම්බර් 31 දිනට රු.66,599,517ක් හා 2023 දෙසැම්බර් 22 දින වන විට 2012 වසරේ සිට ගෙවියයුතු වන රු.89,316,489ක මුදලක් ප්‍රේෂණය කළ යුතුව පැවතුනි.

(ඊ) අංක පීඊඩී/12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු වක්‍රලේඛය 5.1.3 වගන්තිය

සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තුව,මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ

	යුතු නමුත් 2016 - 2020 සංයුක්ත සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.
6.5.1 වගන්තිය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 නොවැම්බර් 13 දින ඉදිරිපත් කර තිබුණි.
(උ) අංක 01/2014 හා 2014 පෙබරවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) ඡේදය හා අංක 12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය	(i) ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු අතර එම ක්‍රියාකාරී සැලැස්ම මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට කලින් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු රේඛීය අමාත්‍යාංශය,රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු නමුත් 2018 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය 2018 පෙබරවාරි 27 දින අනුමත කර විගණනයට ඉදිරිපත් කරනු ලැබුවේ 2018 අප්‍රේල් 11 වන දින දිය.
	(ii) ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කළ යුතු අතර එම ව්‍යාපාර සැලැස්ම මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට කලින් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු නමුත් 2018 වර්ෂය වෙනුවෙන් ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඌ) 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 2013/02 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.7 හා 3.9 ඡේදය	සේවක අර්ථසාධක දායක මුදල් හා සේවක භාරකාර අරමුදල් සඳහා වන දායක මුදල් නිසි පරිදි කලට වේලාවට ප්‍රේෂණය කළ යුතු බවටත් වැටුප්

	ගෙවීමට සමාන ප්‍රමුඛතාවයකින් යුතුව ඒ හා සමගාමීව අදාල ප්‍රේෂණයන් සිදු කරන බවටත් හිඟ දායක මුදල් වර්ධනය නොවන බවටත් ආයතන වල සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරීන්ද , විෂය භාර නිලධාරීන්ද තනි තනිවන් සාමූහිකවත් වගකීමට බැඳෙන නමුත් 2006 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා රු.260,042,623 ක් හා 2022 දෙසැම්බර් 31 දින වන විට ජීවන වියදම් දීමනාව මත ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් රු.178,216,099 ක්ද සේවක භාරකාර අරමුදල් රු.23,130,412ක්ද ගෙවිය යුතුව පැවතුනි.
(ඒ) 2017 අංක 01 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛය	සංස්ථාව සතු සියළු දේපළ පිරියත හා උපකරණ පිළිබඳ නිවැරදි තොරතුරු හා 2018 වසරේ සිට අළුතින් මිලට ගත් හා අපහරණය කරන වත්කම් පිළිබඳ තොරතුරු අදාල කාර්තුව අවසානයේ කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද සංස්ථාව එපරිදි කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව
2011.06.30 දිනැති අංක 1712/21 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව ලංකා ධීවර සංස්ථාව විසින් පහත සඳහන් කාර්යයන් ඉටුකර නොතිබුණි.

- "ස්ව සම්පත් කලාපය" සහ පිළිගත් ජාත්‍යන්තර රීති වලට අනුකූලව ඉන් පිටත මසුන් ඇල්ලීමේ මෙහෙයුම් වල නිරත වීම.
- මත්ස්‍ය පිරිසැකසුම
- විදේශීය සහ දේශීය වෙළෙඳපලවල් වල මසුන් විකිණීම.
- අවශ්‍ය යැයි පෙනී යන අවස්ථාවකදී මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සහ අපනයනය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ යම් කටයුතු සිදු කරගෙන යාම.
- ඉහත කටයුතු වලින් යම් කටයුත්තක් සිදුකිරීම සඳහා දේශීය සහ විදේශීය ආයෝජකයින් සමඟ හවුල් ව්‍යවසාය ගිවිසුම් වලට ඇතුළත් වීම.
- දේශීය සහ විදේශීය නිෂ්පාදකයන් සහ බෙදාහරින්නන් නියෝජනය කිරීම.

ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ අනෙකුත් ආයතන ස්ථාපිත කිරීමත් සමඟ සංස්ථාව වෙත ව්‍යවස්ථාපිතව පැවරී තිබූ ඉහත අරමුණු අතරින් එම ආයතනයන්ගේ විෂය පථයට අයත් අරමුණු කෙරෙහි ධීවර සංස්ථාව අවධානය යොමුකර නොතිබුණු අතර මසුන් සකස් කිරීමේ කටයුතු සහ මසුන් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් අලෙවි කිරීමේ හෝ බෙදාහැරීමේ කටයුතු ඉටු කිරීම පමණක් සිදුකර තිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස , කාර්යක්ෂම ලෙස

සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) අයිස් යන්ත්‍රාගාර 24 ක් 2018 දෙසැම්බර් 31 දින වන විට අක්‍රීය තත්වයේ පැවති අතර ඒවා ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට සංස්ථා කළමණාකාරිත්වය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්ථාව විසින් පරිගණක ගිණුම් කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් තෝරාගෙන එම ආයතනය සමඟ ගිවිසුමකට එලැඹීමකින්ද තොරව 2018 ජුනි 26 දින රු.300,000ක අත්තිකාරම් මුදලක් අදාළ ආයතනයට ලබා දී තිබුණි. 2018 දෙසැම්බර් 31 දින සිට අදළ කොන්ත්‍රාත්තුවෙහි කාර්යසාධන සුරක්ෂණයේ වලංගු කාල සීමාව ද අවසන්ව තිබුණු නමුත් මේ වන විටත් එම පරිගණක ගිණුම් කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

(ඇ) මසුන් ටින්වල ඇසුරුම් කර්මාන්තශාලාවක් ඇරඹීමේ පරමාර්ථයෙන් රුසියානු සමාගමක් සමඟ 2003 වසරේ ඇතිකරගත් බද්ධ ව්‍යාපාරය සඳහා සංස්ථා දායකත්වය ලෙස ඉඩම් අක්කර 01 ½ කින් යුත් ඉඩමක් විකුණුම්කර ඔප්පුවකින් පවරා තිබුණි. මෙය රු.110,000,000ක ආයෝජන දේපළක් ලෙස සළකා තිබුණ ද මේ දක්වා කිසිදු ආදායමක් සංස්ථාව වෙත ලැබී නොතිබුණි. තව ද සංස්ථාව විසින් ඉහත සමාගම වෙත පැවරූ එම ඉඩම නීත්‍යානුකූලව නැවත ලබා ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ අංක DLM 15/2018 දරන නඩුව පවරා තිබුණි.

(ඈ) 2017 පෙබරවාරි 27 දින අමාත්‍යාංශය විසින් සංස්ථාව වෙත රු.මිලියන 65 ක මුදලක් මත්ස්‍ය පිරිසැකසුම් ඒකකයක් ඉදිකිරීම සඳහා ලබා දී තිබූ අතර එයින් රු. 28,024,245 ක් පමණක් එම පිරිසැකසුම් ඒකකය වෙනුවෙන් වැය කර 2018 දෙසැම්බර් 31 දින වන විටත් කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර තිබුණි. ඒ සඳහා ලැබුණු ඉතිරි රු.36,975,755 ක මුදල අදාල අරමුණින් බැහැරව සංස්ථාව වෙනත් කරුණු සඳහා වැය කර තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) උත්සව සමයේ සහන මිලට පොදු මහජනයාට මසුන් සැපයීම අරමුණු කරගෙන මහා භාණ්ඩාගාරය විසින් 2018 මාර්තු 29 දින රු.මිලියන 100 ක මුදලක් සංස්ථාවට ලබා දී තිබූ නමුත් සංස්ථාව විසින් එම අරමුණින් බැහැරව එම මුදල සාමාන්‍ය වියදම් සඳහා වැයකර තිබුණි.

(ආ) සංස්ථාවේ විධායකයන්ගේ ණයගැති හා ණයගිම් යන ශේෂයන්ගේ ශීඝ්‍ර වර්ධනයක් මූල්‍ය ප්‍රකාශ මඟින් හෙළිදරව් වන තත්ත්වයක් තුළ සංස්ථාව විසින් එම ණය ගනුදෙනු සම්බන්ධව විධිමත් වූ ණයපාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට හෝ විධිමත් වූ වැඩපිළිවෙලක් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි තවද සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයන්ගේ ජංගම වගකීම් තුළ පෙන්වන රු.142,922,000,ක් වූ ණය සහ ණයගිම් (loans and borrowings) ශේෂය 2016 වසරේ සිට නොවෙනස්ව ඉදිරියට එනු ලබන අතර නිරවුල් කිරීම අවිනිශ්චිත තත්ත්වයේ විය.

(ඇ) 2013 වර්ෂයේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් යටතේ වන්දි ලබා දී සේවකයින් ඉවත් කර තිබුණ ද සංස්ථාව විසින් 2018 වර්ෂයේදී අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ සේවකයින් 40 දෙනෙකු ද, කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 8දෙනෙකු ද හා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 72 ක් ද බඳවා ගෙන තිබුණි. මේ සඳහා අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවූ අතර ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයේ අරමුණු ද ඉටු වී නොතිබුණි.

(ඈ) විධායකයන් සඳහා කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොමැති බැවින් ඒ ඒ විධායකයන්හි සේවක සංඛ්‍යාවේ අතිරික්තය හා පුරප්පාඩුව හඳුනාගත නොහැකි විය. විධායකයන් 4 ක් සඳහා හා පැලියගොඩ මත්ස්‍ය වෙළඳ සංකීර්ණය සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 06 දෙනෙකු 2018 වසරේ බඳවාගෙන තිබුණි. තව ද මීගමුව විධායකය තුළ 2018 වසරේ ස්ථිර කාර්යය මණ්ඩලය 53 ක්වූ අතර මේ වන විට එම කාර්යය මණ්ඩලය 89 දක්වා වර්ධනය වී තිබුණි. මෙසේ කාර්යය මණ්ඩල පත්කිරීම් පිළිබඳ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවිණි.

(ඉ) 2016 වසරේ රු.247,828,937ක් වූ සංස්ථා ලාභය 2017 වර්ෂයේ රු.2,207,477ක් දක්වා සියයට 99කින් පහත වැටී තිබිය දී 2017 වර්ෂයේදී රු. 4,029,639 ක් හා 2018 වර්ෂයේදී රු.6,356,613 ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබූ අතර 2017 වර්ෂයේ හා 2018 වර්ෂයන්හිදී විගණිත මූල්‍ය ප්‍රකාශන මත පදනම් කර නොගෙන මෙම ගෙවීම් කර තිබුණි.

(ඊ) පැලියගොඩ මත්ස්‍ය සංකීර්ණයට රු.15,013,163ක මුදලක් හා ත්‍රීකුණාමලය මත්ස්‍ය වෙළඳපොල සංකීර්ණයට මත්ස්‍ය වෙළෙඳසැල් කුටි සඳහා රු.2,036,116ක මුදලක් බදු කුලිය වශයෙන් ගෙවිය යුතු විය. මෙම කුලිය අඛණ්ඩව ගෙවීම් සිදුකර නොතිබීම නිසා ගෙවියයුතු බදු කුලිය අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ලංකා ධීවර සංස්ථාව
මූල්‍ය ප්‍රකාශන 2018

අන්තර්ගතය

i	පිරික්සුම් ලැයිස්තුව	
ii	මූල්‍ය ප්‍රකාශනයේ කළමනාකරණ නියෝජනය	
iii	විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	1
iv	මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශය	2
v	ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය	3
vi	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	4
vii	සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති	5-12
viii	මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	13-30

ලංකා ධීවර සංස්ථාව
1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාගත කරන ලදී
විස්තීරණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය/කාලසීමාව සඳහා	උපලේඛන අංකය	සටහන	2018 රු.	2017 රු.
ආදායම්		2	2,941,767,445	2,127,438,604
විකුණුම් පිරිවැය			(2,420,227,594)	(1,624,276,384)
දළ ලාභය			521,539,850	503,162,220
වෙනත් ආදායම්		3	237,207,437	268,306,623
පරිපාලන වියදම්			(671,354,478)	(648,911,436)
විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය			(113,767,262)	(108,411,691)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ප්‍රතිඵල			(26,374,453)	14,145,717
මූල්‍ය පිරිවැය		4	(7,646,393)	(11,938,239)
බදුවලට පෙර ලාභය/(අලාභය)			(34,020,846)	2,207,478
බදු වියදම්			-	-
වර්ෂය සඳහා ලාභය/(අලාභය)			(34,020,846)	2,207,478
වෙනත් විස්තීරණ ආදායම				
විශ්‍රාම වැටුප් සැලසුම් මත ආයුගණනක ලාභ/අලාභ			1,496,830	(38,750,253)
මුළු විස්තීරණ ආදායම			(35,517,676)	40,957,731

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් හෝ අලාභ පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රකාශ කියවිය යුත්තේ පිටු අංක 5 සිට 12 දක්වා ඇති සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් ලෙස සම්පාදනය කරන ආශ්‍රිත සටහන් සමගය.

ලංකා ධීවර සංස්ථාව

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාගත කරන ලදි

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

